# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,608 — 1958 දෙසැම්බර් 5 වැනි සිකුරාද—5.12.1958

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)

# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... | 2703 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... | 2706 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | — |
| ටැන්ඩර් කැඳවීමේ දැන්වීම් ... | 2708 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම්පත් | — |
| තීරණය කළ ටැන්ඩර් පත් පිළිබඳ දැන්වීම් | — | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... | 2719 | විවිධ දැන්වීම් ... | 2719 |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී, ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කායසී සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. **සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය"යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත්, එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූල ව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවාවෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට, ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද, නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **නවප්‍රවේශක නිලධාරීහු.**—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරු වලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන්, කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන් හිදී මිස, අන් හැම අවස්ථාවකදීම ආධුනික/පරීක්ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූල ව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් ස්වකීය ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතු ය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් වීම, ආධුනික/පරීක්ෂා කාලය අවසන් වීමෙන් පසු එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇතැ"යි ඔවුන් එම තනතුරු වලට පත් කළ බලධාරීන් විසින් පිළිගැණෙතොත්, එසේ තනතුරු වලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු සැහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම, එම කාර්යය පිළිබඳ නිසි බලධාරීහුගේ කැමැත්ත පරිදි සිද්ධ වේ.

**(iv)** සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබා රාජ්‍ය සේවාවට ඇතුළු වන නවප්‍රවේශක නිලධාරීහු සිංහල භාෂා ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙත්.

**සංලක්ෂ්‍යය.**—" නවප්‍රවේශක නිලධාරීහු " යනුවෙන් මෙහි දී අදහස් කෙරෙනුයේ 1956 සැප්තැම්බර 24 වැනිද හෝ ඊට පසු ව හෝ රාජ්‍ය සේවාවේ තනතුරුවලට පත් කරනු ලැබුවා වූද, එසේම 1957 මැයි 23 වැනි දින නිකුත් කළ අංක 379 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 2 (ii) (ආ) සහ 2 (ii) (ඇ) දරන අනුච්ඡේදයන්ට අනුකූල ව ආදිප්‍රවේශක නිලධාරීන් වශයෙන් නොසැලකෙන්නා වූද තැනැත්තෝ වෙත්.

**5. අවශ්‍ය සුදුසුකම්.**—තමා ලාංකිකයකු වූ බවට සැහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතු ය. " ලාංකික " යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

**6. යුද්ධසේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙක ම සුදුසුකම් ලැබ සිටින්නා වූද, මහා රාජිනියන් වහන්සේගේ යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූද අයට හා සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි (සිය කැමැත්තෙන් ම සේවයෙන් අස් වූවන් හැර) සෑම කෙනකුට මද, ඔවුහු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩව සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම් ලබා ගැනීම සඳහා පමණක්, ඉතා ඈතින් 1939 සැප්තැම්බර 3 වැනි දිනත්. ඉතා මෑතින් 1949 දෙසැම්බර 31 වැනි දිනත් යන මෙදෑතුර තමන් එසේ සේවයෙහි යෙදී සිටි කාලපරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

**7. වෙනත් අවශ්‍ය කරුණු.**—**(i)** දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින අවශ්‍ය සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරන නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු, එම ඉල්ලුම් කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූල ව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම් ව සිටිත් ද, නැද්ද" යි සඳහන් කොට එවිය යුතු ය.

**(ii)** සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන තැනකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසි ම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නො ලැබේ.

**(iii)** කිසියම් අපෙක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට කමකුව වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

**(iv)** යම් අයැදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දැනගන්ට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාර්යයෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

**(v)** මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නො ගැළපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

---

## රජයේ අභ්‍යාස විද්‍යාලයයන්හි චිත්‍රකම් උපදේශිකා තනතුර

රජයේ අභ්‍යාස විද්‍යාලයවල චිත්‍රකර්ම උපදේශිකා තනතුර සඳහා 1958 දෙසැම්බර් මස 26 වන දින තෙක් කොම්පොඤ්ඤ වීදියේ මලයි විදීයේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටී. සී. ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂ වරයා විසින් ඉල්ලුම් පත්‍ර භාර ගනු ලැබේ.

2. මේ තනතුර සඳහා නියමිත වැටුප් ක්‍රමය රු. 1,344—72—2,424 කි.

3. **අවශ්‍ය අධ්‍යාපන හා අනික් සුදුසුකම් :**

(i) ඉල්ලුම්කරුවන් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ඊට සමාන සහතික පත්‍රයක් හෝ වඩා උසස් අධ්‍යාපන සුදුසුකම් හෝ ලබා අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන චිත්‍රකර්ම සහතික පත්‍රය ද ලබා සිටිය යුතුය. තවද, යටත් පිරිසෙයින් අවුරුදු දෙකක ඉගැන්වීමේ පළපුරුද්දක් ඔවුන් ලබා සිටිය යුතුය.

(ii) 1958.12.26 වැනි දිනට ඉල්ලුම්කරුවන් වයසින් අවුරුදු 22ට අඩු හෝ අවුරුදු 45ට වැඩි හෝ නො විය යුතු ය. රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් සම්බන්ධයෙන් ඉහළ වයස් සීමාව නො යෙදේ.

4. **විශෙෂ කොන්දේසි :**

(i) තෝරා ගනු ලබන ඉල්ලුම්කරු පළමුවරට උයන්වත්ත අභ්‍යාස විද්‍යාලයට පත් කරනත්, ස්ථාන මාරු කර යැවීමට යටත් ය.

(ii) පාඨශාලා ගුරු විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ මෙම තනතුර විශ්‍රාම වැටුප් සහිත ය. මෙම තනතුර සඳහා තෝරා ගැනීමට පෙර විශ්‍රාම වැටුප් වාර්තා යටතේ ශික්ෂකයකු වශයෙන් විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරන ගුරුවරියක පත්කරනු ලැබුවහොත්, ඇය මෙම තනතුර දරන තෙක් මේය විශ්‍රාම වැටුප් සහිත යයි ප්‍රකාශ කරනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදය පටන් ගැන්මේ පළ කර තිබෙන රජයේ සේවයේ තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන සාමාන්‍ය කොන්දේසි ද බලනු මැනවි.

ඊ. එච්. ද අල්විස්,
අධ්‍යාපන අධ්‍යක්ෂ වෙනුවට.

අංකය : ටී. සී. සී. 2490,
1958 නොවැම්බර් මස 28 වන දින,
කොළඹ 2, මලයි වීදියේ
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ය.

### ආදර්ශ පෝරමය

**උයන්වත්ත රජයේ අභ්‍යාස විද්‍යාලයයේ චිත්‍රකර්ම උපදේශිකා තනතුර පිළිබඳ ඉල්ලුම් පත්‍රය**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
2. ලිපිනය :————.
3. 1958.12.26 වැනි දිනට නිවැරදි වයස: අවුරුදු——, මාස——, දින——.
4. ජාතිය හා එය ලබා ගත් අන්දම :————.
5. උපන් ස්ථානය—
   (අ) ඉල්ලුම්කරු :————.
   (ආ) ඇගේ පියා :————.
   (ඉ) ඇගේ පියාගේ පියා :————.
   (ඊ) ඇගේ පියාගේ පියාගේත් පියා :————.
6. ලබාගත් දින සමඟ ශාස්ත්‍රීය සුදුසුකම් (ලබා තිබෙන උසස්ම අධ්‍යාපන සහතික පත්‍රවල පිටපතක් ඇමිණිය යුතුය)
7. වෘත්තීය සුදුසුකම් :————.
8. ඉගෙනීම ලැබූ පාඨශාලා හා විද්‍යාල (ඇතුළත් වූ හා අස් වූ දින සඳහන් කළ යුතු ය) :————.
9. දැනට යෙදී සිටින රක්ෂාව :————.
10. ඉගැන්වීමේ පළපුරුද්ද (මෙහි පහත දැක්වෙන පෝරමයෙහි විස්තර සඳහන් කරන්න) :————.

    පාඨශාලාවේ හෝ විද්‍යාලයේ නම :————.

    ඇතුළත් වූ දිනය :————.

    අස් වූ දිනය :————.

    දැරූ තනතුර :————.

    සේවා කාලය අවුරුදු——, මාස——, දින————.

    අස්වීමට හේතුව :————.

    මුළු කාලය :————.
11. සිංහල භාෂාවෙන් ලබා තිබෙන සුදුසුකම් :————.
12. චරිත සහතික ලබාගත් අයගේ (ඥාතීන් නොවෙයි) නම් හා නිලතල ; සහතික තුනක පිටපත් (මුල් පිටපත් නො වෙයි) ඇමිණිය යුතු ය. රජයේ සේවකයන් සම්බන්ධයෙන් මේය අනවශ්‍ය ය.
13. අනික් විස්තර :————.

ම විසින් මෙම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට මම මෙයින් සහතික කරමි. මේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය හෝ වැරදි දෙයක් ලියා තිබෙන බව තේරීමට කලින් අනාවරණය වුවහොත් මා එයින් ම නුසුදුසු බවට පැමිණෙනවා පමණක් නොව, තේරීමෙන් පසු ඒ බව දැනගන්නට ලැබුනොත්, කිසිම වන්දියක් රහිතව, මා රාජකාරියෙන් පහ කර දැමීමට යටත් වන බව ද මම දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

## රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

### සිංහල භාෂා පරිවර්තක තනතුරු

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ සිංහල භාෂා පරිවර්තක තනතුරු තුනක් සඳහා අයදුම් පත් එවන ලෙස සුදුස්සන්ට මෙයින් ආරාධනය කරමි. මෙහි පහත දක්වෙන ඉල්ලුම් පත්‍රයේ අන්දමට පිළියෙළ කරන ලද අයදුම්පත් වර්‍ෂ 1958 දෙසැම්බර් මස 19 වැනි දිනට පෙර මට ලැබෙන්නට එවිය යුතු ය.

2. වැටුප.—මේ තනතුරුවලට නියමිත වැටුප් ක්‍රමය, රුපියල් 3,900—රුපියල් 180 හා රුපියල් 240—රුපියල් 6,540.

3. සේවයේ කොන්දේසි.—

(i) මේ තනතුරු ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිත ය ; මේ තනතුරකට තෝරා ගනු ලබන අපේක්‍ෂකයා තුන් අවුරුද්දකට නො වැඩි ආධුනික කලයක් සහිත ව පත් කරනු ලැබේ.

(ii) සුළු කාලයක් ඇතුළත දී තනතුරුවල වැඩ බාර ගන්නා ලෙස තෝරාගත් අපේක්‍ෂකයන්ට නියම කරනු ලැබේ.

(iii) තනතුරට අයත් කාර්ය නම්, ලිපි ලේඛනාදිය ඉංග්‍රීසියෙන් සිංහලට පරිවර්තනය කිරීම සිංහලයෙන් ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම, අනෙක් දෙපාර්තමේන්තු වලින් එවන සිංහල පරිවර්තනයන් ප්‍රතිශෝධනය කිරීම සහ දෙපාර්තමේන්තුවෙන් නියම කෙරෙන වෙනත් කටයුතු කිරීම ද වේ. භාෂා පිළිබඳ විශේෂ ප්‍රවීණත්වයක් ඔවුන්ගෙන් බලාපොරොත්තු වනු ලැබේ.

(iv) උසස් සුදුසුකම් හා පළපුරුද්ද අනුව යම් යම් අපෙක්‍ෂකයන් මේ තනතුරු වලට විශිෂ්ට ලෙස යොග්‍ය වුවහොත්, ඔවුන්ට, වැටුප් ක්‍රමයේ මූලික පියවරෙහි සිට නො ව අන් කිසි සුදුසු පියවරක සිට වැටුප් ගෙවීමට සැලැස්විය හැකි ය.

4. අවශ්‍ය සුදුසුකම්.—හැම අයදුම්කරුවකු ම—

(අ) සිංහලය විෂයයක් වශයෙන් ඇති උපාධියක්, පිළිගත් විශ්ව විද්‍යාලයකින්, ලැබූ අයකු බවට ; නැත හොත්

(ආ) සිංහල භාෂා පරිවර්තකයකු වශයෙන් දහ අවුරුද්දක පළ පුරුදුකම ඇත්තා වූ, හෝ තමා යටත් පිරිසෙයින් උපාධි ධරයන්ට සමාන ප්‍රවීණතාවක් ඇති උගතකු බව තේරීමේ සභාවට ඒත්තු යන සේ කරුණු ඉදිරිපත් කළ හැකි ලේඛකයකු නොහොත් ග්‍රන්ථ කර්තෘවරයකු වූ හෝ බව ටත්, ඉංග්‍රීසිය පිළිබඳ ඉතා හොඳ දැනුමක් ඇත්තාවූ අයකු බවටත් ;

(ඇ) දැන් ආණ්ඩුවේ සේවයෙහි යෙදී නො සිටිතොත් 1958 දෙසැම්බර් මස 19 වැනි දට තමාගේ වයස අවුරුදු 25ට නො අඩු බවටත් 50ට නො වැඩි බවටත් ;

(ඈ) විශිෂ්ට චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බවටත් සෑහෙන සාක්‍ෂ්‍ය ඉදිරිපත් කළ යුතු ය.

5. හැම අයදුම්කරුවකු ම විසින් පහත පෙනෙන සහතික වල පිටපත් (මුල් ලිපි නොවේ) තම අයදුම්පතට අමුණා එවිය යුතු ය :—

(අ) උප්පැන්න සහතිකය (සැළකිය යුතුයි.—බව්තීස්ම සහතික පත්‍ර හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් කටයුතු සඳහා දෙන සහතික පත්‍ර බාර ගනු නො ලැබේ ;

(ආ) උසස් ම අධ්‍යාපනික සුදුසුකම් සහ/හෝ වෘත්තීය සුදුසුකම් පිළිබඳ ලැබූ සහතික පත්‍රය ;

(ඇ) අයදුම්කරුගේ සුදුසුකම්, චරිතය, මේ තනතුරට ඇති යෝග්‍යතාව යන මේවා සම්බන්ධයෙන් මෑත දී ලබාගන්නා ලද සහතික තුනක් (රාජ්‍ය සේවාවෙහි සිටින අයදුම්කරුවන්ගෙන් මේ බලාපොරොත්තු නො වේ).

**සැලකිය යුතුයි.**—සහතික පත්‍ර වල හා චරිත සහතික පත්‍ර වල පිට පත් ආපසු එවනු නො ලැබේ.

6. ආණ්ඩුවේ සේවයෙහි නියුක්ත නිලධාරීන් එවන අයදුම්පත් නියමිත දිනයෙන් පසු ව මෙහි ලැබුණොත්, ඒ අයදුම්පත් බාරගනු ලබන්නේ ඒවා නියමිත දිනයට කලින් දෙපාර්තමේන්තු ප්‍රධානියාට ලැබී තිබුණ හොත් ද, ඒවා ප්‍රමාද වීමට සෑහෙන හේතු දක්වමින් එම අයදුම් පත් භාර ගන්නා ලෙස දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා නිර්දේශ කළ හොත් ද, පමණකි.

7. අයදුතුපත් හා ඒ පිළිබඳ සෙ සුලියුම් කියුම් එවිය යුත්තේ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ යම්කිසි නිලධාරියකුගේ පෞද්ගලික නමට නො ව, රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ විශෙෂ කොමසාරිස් හට ය.

8. ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදයෙහි පළ වූ ද, රාජ්‍ය සේවාවේ තනතුරුවලට කෙරෙන පත් කිරීම් පිළිබඳ වූ ද පොදු කොන්දේසි බලනු මැනවි.

9. එවන හැම අයදුම්පතක් ම මෙහි ලැබුණු බව දන්වා එවනු ලැබේ. අයදුම්පත් බාර ගන්නා අවසාන දිනයේ සිට, තුන් දවසක් ඇතුළත එවැනි දැන්වීමක් යම් අයදුම්කරුවකුට නො ලැබුණොත් ඔහු විසින් ඒ බව රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ විශේෂ කොමසාරිස් හට වහා ම දන්වා එවිය යුතු ය. එසේ ගනා කරන අයගේ හිමිකම් ගැන සලකනු නො ලැබේ.

රාජ්‍යභාෂා කටයුතු පිළිබඳ
විශේෂ කොමසාරිස්.

1958 දෙසැම්බර් මස 5 වැනිද,
රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 598,
22, රීඩ් මාවත, කොළඹ 7.

## රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

### සිංහල පරිවර්තක තනතුරු සම්බන්ධ ඉල්ලුම් පත්‍රය

(1) අයදුම්කරුගේ සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————

(අ) අගට යෙදෙන නම :————.

(ආ) අනිත් නම් :————.

(2) ලිපිනය :————.

(3) (අ) වර්‍ෂ 1958 දෙසැම්බර් 19 වැනි දින ට සම්පූර්ණ වයස— අවුරුදු :————. මාස :————. දවස් :————.

(ආ) උපන් දිනය හා ස්ථානය (උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතුයි).

(4) රටවැසි භාවය සහ එය කෙසේ හිමි වී ද යන බව :————.

(5) (අ) පියාගේ සම්පූර්ණ නම :————.

(ආ) පියා උපන් දින සහ ස්ථානය :————.

(ඉ) ඔහුගේ රටවැසි භාවය :————.

(6) අයදුම්කරු විවාහක ද, අවිවාහක ද, කනවැන්දුම් ද යන බව (විවාහක නම් විවාහ වූ දිනයත් දරුවන් ගණනත් සඳහන් කළ යුතු යි) :————.

(7) මූලික අධ්‍යාපනය ලත් පාඨශාලා සහ විද්‍යාල (ඒවාට ඇතුළත් වූ සහ අස් වූ දින සඳහන් කළ යුතු යි :————.

(8) (අ) ශාස්ත්‍රාලයීය සහ වෘත්තීය සුදුසුකම් (ඒවා ලත් දිනත්, සාමාර්ථ්‍ය ලැබූ පෙළත් සඳහන් කළ යුතු යි. සහතික පිට පත් ද අමුණා එවිය යුතු යි) :————.

(ආ) සිංහල සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් සාමාර්ථ්‍යය ලත් උසස්ම විභාගය—

සිංහල :————.

ඉංග්‍රීසි :————.

(9) (අ) පරිවර්තක වැඩ සම්බන්ධයෙන් පළපුරුදුකම් තිබේ නම් දින සමග විස්තර සඳහන් කරන්න :————.

(ආ) සාහිත්‍යය කෘතීන් කර පළපුරුදුකම් තිබේ නම් දින සමග ඒවා ද සඳහන් කරන්න :————.

(10) (අ) පාඨශාලාවෙන් හෝ විද්‍යාලයෙන් හෝ අස් වූ පසු නියුක්ත ව සිටි රක්ෂා වල් ද, ඒ පිළිබඳව වකවානු ද, ලැබූ වැටුප් ද සඳහන් කරන්න :————.

(ආ) රජයේ සේවයේ යෙදී සිටි නම්, තත්ත්වයත්, වාර්ෂික වැටුපත් සඳහන් කරන්න :————.

(11) විශේෂ පළපුරුදු, පුහුණුවීම්, සුදුසුකම් සහ හිමිකම් :————.

(12) පෞද්ගලික ලෙස ආශ්‍රය කරන තිදෙනකුගේ නම් (තත්ත්වය සහ ලිපිනය සඳහන් කරන්න. මේ අය ඔබේ ඥාතීන් නො විය යුතු යි)—

(i) :————.
(ii :————.
(iii) :————.

(13) චරිත සහතික දී ඇති අයගේ නම් සහ තත්ත්ව (ඥාතීන් නො විය යුතු යි. මෑතක දී ලත් චරිත සහතික වල පිටපත් පමණක් අමුණා එවිය යුතු යි) :————

(14) මුදල් කරදර නැති වූවෙක් ද යන වග—නැති නම් ණය ප්‍රමාණය (ගණන් විස්තර කරන්න) :———— .

(15) වෙනත් කරුණු :————.

මෙහි සඳහන් කර ඇති යම්කිසි කරුණක් වැරදි හෝ අසත්‍ය බව හෝ පත්වීම දෙන්නට පෙර හෙළිවුවහොත් මගේ අපෙක්‍ෂකත්වය අවලංගු කිරීමට ද, පත්වීම ලැබුවාට පසු හෙළිවුවහොත් කිසි ම වන්දි ගෙවීමක් නැති ව, මා නිලයෙන් අස් කිරීමට ද යටත් වන බව මම දැන සිටින බව ද, මේ අයදුම් පතෙහි දක්වෙන සියලු විස්තර සත්‍ය බව ද නිවැරදි බව ද මෙයින් සහතික කරමි.

අයදුම්කරුගේ අත්සන :————.

දිනය :————.

## කෘෂිකම් දෙපාර්තමේන්තුව

### පළ වැනි ශ්‍රේණියේ ෆේපා්මන් තනතුරු

පළ වැනි ශ්‍රේණියේ ෆේපා්මන් තනතුරු සඳහා අයදුම් පත් භාර ගනු ලැබේ.

2. **වේතනය :**—මෙම තනතුරට අදාල පඩි ක්‍රමය අවුරුද්දකට රුපියල් 2,820—9 × 120 සහ 8 × 180—රු. 5,340 කි.

(තෝරාගත් අයදුම් කරුවන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව ඔවුන්ට වේතන පරිමාණයේ වැටුප් වැඩි කිරීමෙන් සහනයක් දීමට සැහේ නම් භාණ්ඩාගාරයේ උපදෙස් අනුව එසේ කරනු ලැබේ.)

3. **සේවයේ කොන්දේසි :**—

(i) තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය.

(ii) අවුරුදු තුණක පරීක්ෂා කාලයකට අයදුම්කරු භාජන වේ.

(iii) දිවයිනේ ඕනෑම ස්ථානයක සේවය සඳහා තෝරාගත් අයදුම්කරු සූදානම් විය යුතුය.

4. **අවශ්‍ය සුදුසුකම් :**—සෑම අයදුම්කරුවෙක්ම ඔහුට පහත සඳහන් සුදුසුකම් ඇති බවට සාක්ෂි තිබිය යුතුය.

(i) සිංහල හෝ ඉංග්‍රීසි හෝ ජ්‍යෙෂ්ඨ විභාගයෙන් සමත්වීම හෝ, ඒ හා සමාන විභාගයකින් සමත්ව සිටීම හා, පුරුදුවීමේ සේවා කාලය හැරුණු විට වැඩපළක අට අවුරුදු පුහුනුවක් තිබීම.

නැතහොත්, සිංහල හෝ ඉංග්‍රීසි හෝ කනිෂ්ඨ විභාගයෙන් සමත්වීම හෝ ඒ හා සමාන විභාගයකින් සමත්වී සිටීම හා පුහුණුවීමේ සේවා කාලයත් ඇතුළුව වැඩ පළක අවුරුදු 15 ක පුහුණුවක් තිබීම, මෙයින් අවුරුදු 8 කට නොඅඩු කාලයක් පරිපාලනමය වශයෙන් පිළිගත් වැඩ පලක හෝ රජයේ කාර්මික දෙපාර්තමේන්තුවක විය යුතුය.

(ii) හොඳ චරිතයක් හා අවුරුදු 45 ට නොවැඩි වයසක් තිබීම වඩා උචිතය.

5. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් වලට පහත සඳහන් සහතික යන්ගේ පිටපත් ඇමිණිය යුතුය.

(i) උප්පැන්න සහතිකය.

(ii) අධ්‍යාපනය සම්බන්ධයෙන් ලබා ඇති උසස්ම සහතිකය.

(iii) චරිතය සම්බන්ධයෙන් නොබෝද ලබාගත් සහතික තුනක්.

(iv) කාර්මික සුදුසුකම් හා පලපුරුද්ද සම්බන්ධයෙන් ඇති සහතික.

6. පහත දී ඇති ආකෘති පත්‍රයේ අන්දමට සකස් කර ගත් අයදුම් පත්‍ර 1958 දෙසැම්බර් මස 31 වැනි දිනට හෝ ඊට ප්‍රථම පේරාදෙනියේ කෘෂිකම් අධ්‍යක්ෂ තුමාට ලැබෙන සේ එවිය යුතුය. කෘෂිකම් අධ්‍යක්ෂ තුමාගේ පුද්ගලික නමට නොඑවිය යුතුය.

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි භාගයෙහි II වැනි ඡේදයෙහි මුලින්ම දක්වා ඇති රාජ්‍ය සේවා තනතුරු වලට අදල වන සාමාන්‍ය කොන්දේසිද බලන්න.

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකම් අධ්‍යක්ෂ.

1958 නොවැම්බර් මස 24 වැනිද,
පේරාදෙනියේ,
කෘෂිකම් දෙපාර්තමේන්තුවේදීය.

### පළවැනි ශ්‍රේණියේ ෆේපා්මන් තනතුරු සඳහා අයදුම් පත්‍ර යසි.

1. නම :————.
2. ලිපිනය :————.
3. ජාතිය :————.
4. වයස හා උපන් දිනය :————.
5. අයදුම්කරුගේ පියා උපන් දිනය හා ස්ථානය :————.
6. උසස්ම අධ්‍යාපන සුදුසුකම් :————.
7. කාර්මික සුදුසුකම් :————.
8. පළපුරුද්ද :————.
9. වෙනත් සුදුසුකම් :————.
10. චරිතය පිළිබඳ සහතික ඉදිරිපත් කරන්නාවූ තිදෙනාගේ නම් :————.
    1. :————.
    2. :————.
    3. :————.

මෙම අයදුම් පත්‍රයෙහි මවිසින් ප්‍රකාශ කරන ලද කරුණු නිවැරදි හා සත්‍ය ඒවා බවට සහතික කරමි. මෙහි ඇති කරුණු වැරදි හෝ අසත්‍ය බව තෝරාගන්ට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වෙනවා පමණක් නොව, පත්වීමෙන් පසුව අනාවරණය වුවහොත් කිසිම වන්දි මුදලක් නොමැතිව සේවයෙන් පහ කිරීමට හේතුවන බවද මම හොඳ හැටි දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය.
පේරාදෙණියේ,
කෘෂිකම් අධ්‍යක්ෂට.

---

# විභාග, විභාග ප්‍රතිඵල

## සිවිල් නිලධාරීන් සහ රජයේ අනෙක් නිලධාරීන් සඳහා පැවැත්වෙන ත්‍රෛමාසික පරීක්ෂණය

සිවිල් සේවයේ යෙදී සිටින නිලධාරීන් සහ රජයේ අනෙක් නිලධාරීන් සඳහා පැවැත්වෙන ත්‍රෛමාසික පරීක්ෂණයක් 1959 ජනවාරි මස පහත පළවන දිනයන්හිදී පැවැත්වේ :—

| | | |
|---|---|---|
| ජනවාරි 20 වැනි අඟහරුවාද ... | නීතිය | සිවිල් සේවයේ සහ විදේශ සේවයේ යෙදී සිටින්නන් විසින් මේ දිනවල මෙම විෂයයන් ගන්නවා ඇත. |
| ජනවාරි 21 වැනි බදාද ... | නීතිය | |
| ජනවාරි22 වැනි බ්‍රහස්පතින්ද ... | සිංහල, ලිඛිත | |
| ජනවාරි 23 වැනි සිකුරාද ... | දෙමළ, ලිඛිත | |
| ජනවාරි 24 වැනි සෙනසුරාද ... | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නීති සහ පාලන රෙගුලාසි : ලංකා ඉතිහාස සහ භූගෝල විද්‍යාව : ගණන් තැබීම. | |
| ජනවාරි 26 වැනි සඳුද ... | නීතිය (අනෙක් නිලධාරින් සඳහා. | |
| ජනවාරි 27 වැනි අඟහරුවාද ... | සිංහල (වාචික). | |
| ජනවාරි 28 වැනි බදාද ... | දෙමළ (වාචික). | |

(මේ කාල සටහන් වෙනස් කිරීමට ඉඩ තිබේ.)

2. විදේශ සේවයේ ආධුනිකයන්, පොලිස් හමුදාවේ නිලධාරීන්, සුරාබදු දෙපර්තමේන්තුව, බන්ධනාගාර දෙපාර්තමේන්තුව, කැලෑ දෙපාර්තමේන්තුව, සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව, රබර් කොමසාරිස් වරයාගේ දෙපාර්තමේන්තුව, ගුවන් සේවා දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තුවල නිලධාරීන්, සහකාර ආහාර පාලක නිලධාරීන් (තාවකාලික) සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පාලක නිලධාරීන් සඳහා පැවැත්වෙන විභාගයන් :

රජයේ වැඩ දෙපාර්තමේන්තුව, මිනින්දෝරු දෙපාර්තමේන්තුව, තැපැල් සහ විදුලි පණිවුඩ දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්ත මේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, දුම්රිය දෙපාර්තමේන්තුව, වරාය ඉංජිනේරු තැනගේ දෙපාර්තමේන්තුව (කොළඹ වරාය කොමිෂම), විදුලි කටයුතු දෙපාර්තමේන්තුව, වෙළඳ දෙපාර්තමේන්තුව, කර්මාන්ත දෙපාර්තමේන්තුව, සමාජ සේවා දෙපාර්තමේන්තුව, කම්කරු දෙපාර්තමේන්තුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාතීමේන්තුව, සමූපකාර සංවර්ධන දෙපාතීමේන්තුව සහ ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාතීමේන්තුව යන දෙපාතීමේන්තුවල නිලධාරීන් සඳහා පැවැත්වෙන වාචික පරීක්ෂණයක් එකම දිනකදී එකම ස්ථානයකදී පැවැත්වේ.

3. පහතින් දැක්වෙන අන්දමට, පුල්ස්කැප් පිටුබාගයක පිළියෙල කරගත් අයදුම්පත්‍ර අයදුම් කරුවන් විසින් එවිය යුතුය.

4. විභාගය පැවැත්වෙන්නේ විභාග කොමසාරිස් තුමන් යටතේය. එබැවින් විභාගය පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීති සහ රෙගුලාසි වලට අයදුම් කරුවන් යටත් වෙනවා ඇත.

5. ඉල්ලුම්පත්‍ර, දෙපාර්තමේන්තුවේ ප්‍රධානයන්ගේ මාර්ගයෙන් කොළඹ 2, මැලේ වීදියේ විභාග කොමසාරිස්තුමන් වෙත 1958 දෙසැම්බර 29 වැනි දිනට පෙර රෙජිස්ටර් තැපැලෙන් යැවිය යුතුය. ප්‍රමාදවී ලැබෙන කවර ඉල්ලුම් පත්‍රයක් වුවද ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

ඇස්. ඇෆ් අමරසිංහ,
භාණ්ඩාගාරයේ ලේකම්.

මුදල් අමාත්‍යාංශය, කොළඹ.
1958 නොවැම්බර 26 වැනි දින.

## අයදුම් පත්‍රය

### ලංකාවේ විභාග දෙපාර්තමේන්තුව

සිවිල් සේවය, විදේශ සේවය සහ රජයේ අනෙක් සේවයන්හි යෙදී සිටින (වෛද්‍ය සේවයේ යෙදී සිටින්නන් හැර) නිලධාරීන් සඳහා පැවැත්වෙන ත්‍රෛමාසික පරීක්ෂණය—ජනවාරි/අප්‍රේල්/ජූලි/ඔක්තෝබර්, 195........

(නොයෙදෙන වචන කපන්න)

කොළඹ 2, මැලේ වීදියේ විභාග කොමසාරිස්තුමන් වෙත නම දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ මාර්ගයෙන් රෙජිස්ටර් තැපෑලෙන් යවනු සඳහා ය.

ඉල්ලුම් පත්‍ර බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ විභාගයේ නම සඳහන් කරන්න.

(1) පෙළපත් නම :————.
අනෙක් නම් :————.

(2) තනතුර :————.
දෙපාර්තමේන්තුව :————.

(3) ලිපිනය : (ප්‍රවේශ පත්‍රය එවනු සඳහාය) :————.

(4) ඔබ යෙදී සිටින්නේ සිවිල් සේවයේද, විදේශ සේවයේද, එසේ නැත්නම් ඔබ අයිති කවර දෙපාර්තමේන්තුවකටද ? නො එසේ නම් ඔබ වාණිජ අයදුම් කරුවෙක්ද ? ————.

(5) විභාග දෙකකට පෙනී සිටීමට ඔබට සිදුවී ඇත්නම් මේ ඇතුළත් වන්නේ පළමුවැන්නටද, දෙවැන්නටද ? ————.

(6) ඔබ ගන්නා විෂයයන් පැහැදිලි ලෙස සටහන් කරන්න :—
(ඔබ ගන්නේ ව්‍යවහාර භාෂාවද, ලේඛන භාෂාවද නැතහොත් ඒ දෙකමද ?) සිංහල හෝ දෙමළ විෂයයක් වශයෙන් ගන්නා සිවිල් නිලධාරීන් තමන් පෙනී සිටින්නේ පහළ පන්තියේ ප්‍රශ්න පත්‍රයටද, නැත්නම් උසස් පන්තියේ ප්‍රශ්න පත්‍රයට ද යන්න සඳහන් කළ යුතුය.

1. ————.
2. ————.
3. ————.
4. ————.
5. ————.
6. ————.

(7) අයදුම්කරුගේ අත්සන සහ දිනය :————.

විභාග කොමසාරිස්තුමන් වෙත ය,
ඉහතින් දැක්වෙන අයදුම් පත්‍රය ඉදිරිපත් කරමි.

ඉහත සඳහන් කරන ලද තොරතුරු ඇතුළත් අපේක්ෂකයා විභාගය සඳහා සුදුසු සතු බව, මම සහතික කරමි.

දෙපාර්තමේන්තුවේ ප්‍රධානයාගේ අත්සන සහ තනතුර.

දිනය :————.

---

අංකය : 74/7/46 (එම් එෆ්)

### නිවේදනය යි

සිවිල් සේවය පිළිබඳ 1950 මැයි මස 22 වැනි දින දරණ වාතීාවේ 15 වැනි කොටසේ වගන්තිය අනුව සිවිල් සේවකයන් සඳහා පැවැත්වෙන ද්විතීය පරීක්ෂණයෙන් පහත නම් සඳහන් නිලධාරීන් සාමාර්ථය ලබා සිටිති :—

ලැබූ ලකුණු (100 ට)

| නම | සිංහල | දෙමළ | නීතිය | ගණන් තැබීම | රාජ්‍යසේවා කොමිෂමේ නීති සහ පරිපාලක නීති |
|---|---|---|---|---|---|
| ඩබ්ලිව්. පත්මනාතන් | 59 | 72 | 63 | 75 | 53 |
| ඩබ්ලිව්. එල්. පී. ද මැල් | 91 | 57 | 63 | 75 | 51 |

එස්. එෆ්. අමරසිංහ,
භාණ්ඩාගාරයේ ලේකම්.

1958 නොවැම්බර් 27 වෙනි දින,
කොළඹ, මුදල් අමාත්‍යාංශයේ දී ය.

### නිවේදනය යි

1958 ඔක්තෝබර් මස 14 වැනි දින පවත්වන ලද සිවිල් සේවකයන්ගේ ප්‍රථම පරීක්ෂණයෙන් පහත සඳහන් නිලධාරීහු සාමර්ථය ලබා සිටිති :—

ලැබූ ලකුණු ගණන් (100 ට)

| නම | නීතිය | ගණන් තැබීම | සිංහල | දෙමළ | ලංකා ඉතිහාසය සහ භූගෝලය |
|---|---|---|---|---|---|
| එච්. එල්. ගුණසේකර | 81 | 55 | — | 50 | 56 |
| ඒ. ආර්. එම්. ජයවර්ධන | 87 | 66 | — | 51 | 65 |

එස්. එෆ්. අමරසිංහ,
භාණ්ඩාගාරයේ ලේකම්.

1958 නොවැම්බර් 27 වෙනි දින,
කොළඹ, මුදල් අමාත්‍යාංශයේ දී ය.

---

අංකය : ඊබීඒ/35/57.

## වර්ෂ 1958 මාර්තු මස පැවැත්වූ ආරෝග්‍යශාලා ලිපිකරු විභාගයේ ප්‍රතිඵල

වර්ෂ 1958 මාර්තු මස පැවැත්වූ ආරෝග්‍යශාලා ලිපිකරු විභාගයේ ප්‍රතිඵල අනුව පහත නම් සඳහන් අයදුම්කරුවන් ආරෝග්‍යශාලා ලිපිකරු සේවයේ II වැනි පන්තියේ ලිපිකරු තනතුරුවලට පත් කිරීම සඳහා තෝරාගෙන ඇති බැව් මෙයින් දන්වනු ලැබේ :—

| නම | ලිපිනය |
|---|---|
| අබේරත්න බණ්ඩා, වයි. ඇම්. ... | කෝ/දෙළුව රජයේ මිශ්‍ර පාසැල, වැලිගල්ල, ගම්පොල. |
| අලහකෝන්, පී. ඇස්. ... | "සම්පූපාය" වැටකේපොත මතුරට |
| ඇල්බට් සිල්වා, කේ. කේ. ඩබ්ලිව්. | නල්පොල, ඉලුක්හේන. |
| අමරදාස, ඕ. ඩබ්ලිව්. ඩී. ... | නාගොඩ, බෝඹුවල. |
| අමරසිංහ ආරච්චිගේ, පී. | නයිවල පාර, උඩුගම්පල. |
| අමරතුංග, ඩබ්ලිව්. ඇල්. ඇන්. | කළුහේන්පොල, අක්මීමන. |
| ආරියපාල, ඩී. ඇල්. ... | ඉපිටහේන, වැවහමන්ඩුව, මාතර. |
| ආරියපාල, අයි. කේ. ඩී. කිව්. | උප ලිපිකරු, ගම්සභා කාර්යාලය, උඩුනුවර, ගඟ පළාත, ගෙලිඔය. |
| ආරියපාල ආර්. ... | දෙල්පැණිගෙ වත්ත, රිච්මන්ඩ් හිල්, ගාල්ල. |
| ආරියරත්න එච්. ඩී. ... | පලාගල, උඩහේන්නැන්න. |
| ආරියසේන, ඩී. ... | තොන්ඩිලේ, බාතියගම, දික්වැල්ල. |
| බණ්ඩාර, පී. ඒ. ... | අළුත් පාර, පළාතොට, දකුණු කළුතර. |
| දයාරත්න, ආර්. වී. ... | වලගම්බාහුව, මරදන්කඩවල. |
| ද සිල්වා, ඇස්. ටී. ... | නේල්ලිගොඩ, අහුන්ගල්ල. |
| ඩයස්, ඩබ්ලිව්. පී. ... | වී. ඩී. රත්නතුංග මහත්මයා බාරේ, අරන්වල, බෙලිඅත්ත. |
| දිසානායක, ඩී. ... | කේ. 54, මොඩල් හවුසස්, බදුලු පිටිය බදුල්ල. |
| එදිරිසිංහ, කේ. ඩී. එච්. ... | වැදිගම, නෙළුන්දෙනිය. |
| එලාරිස්, කේ. ඩී. ... | 177, හයිලෙවල් පාර නුගේගොඩ. |
| ගුණවර්ධන, එච්. පී. ... | "දෙවල්කන", නෙළුවතුඩුව, වග. |
| ගුණවර්ධන, පී. ද වාස්. ... | ගොරකපොල, පානදුර. |

| නම | | ලිපිනය |
|---|---|---|
| ගින්නි බබා, ඒ. ආර්. ඩී. | ... | අදියර, වත්ත, උඩ කොටස, උඩු පුස්සැල්ලාව. |
| ජයකොඩි, ඇල්. | ... | බෙරිල් වත්ත, බද්දේගම. |
| ජිනදාස, ජී. | ... | පරමානන්ද විද්‍යාලය, හියුම්පර,, ගාල්ල. |
| ජිනදාස, ඩබ්ලිව්. ඩී. | ... | වේරවැල්ල, ඉඳුල්ගොඩ කන්ද. |
| ජිනසේන, ඒ. | ... | ඤාණානන්ද මාවත, ඇත්කඳුර, අම්බලන්ගොඩ. |
| ජෝන් සිංඤෝ, වයි. ඩී. | ... | කොස්ගොවුව, නීල්ලව, හොරණ, |
| කන්දසාමි, ඒ. කේ. | ... | උණ රෝහල, අංගොඩ. |
| කන්දසාමි, එස්. | ... | සුරුවිල්, කයිට්ස්. |
| කන්තන්ගර, ඩී. එච්. | ... | රජයේ මිශ්‍ර පාසල, අතුගොඩ, වීරකැටිය. |
| කරුණාසේන, ඒ. ජී. | ... | ගුළුගහ හන්දිය, ගෝනාපීනුවෙල. |
| ලීලාරත්න, ඩී. | ... | වතුයාය, කුරුවිට. |
| මානවඩු, එම්. | ... | 159, බදගිරිය, ගොවිජනපදය, වැලිගැට්ට. හම්බන්තොට. |
| මාරසිංහ, එම්. එම්. ඒ. | ... | ගම්සභා කාර්යාලය, අඹගමුව, ගිනිගත්හේන. |
| මුණසිංහ, ආර්. ඩබ්ලිව්. ද ඇස්. | | 62, බෝතේජු පාර, දෙහිවල. |
| නමසිවායම්, ඇස්. | ... | රාජ්‍ය භාෂා දෙපාතීමේන්තුව, ප්‍රකාශන අංශය. 421, බුලර්ස් පාර, කොළඹ 7. |
| පාක්‍යනාදන්, පී. | ... | 520/79, වරාය පාර, බ්ලුමැන්ඩල් පාර, කොළඹ 13. |
| පද්මනාදන්, වී. | ... | සංගත්තානෙයි, චාවාකච්චේරිය. |
| පෙරේරා, එච්. ඩී. එච්. | ... | රජයේ කණිෂ්ඨ පාසැල, වැවගම, කුරුණෑගල. |
| පියදාස, ඩී. ජී. | ... | නිකපොත, කේයු/බෝපිටිය. |
| පියදාස, කේ. ජී. | ... | ආරිය නිවස, පිලදූව, මාතර. |
| පියසේන, ඇස්. ඩී. | ... | වැවගම, කුරුණෑගල. |
| පියසේන, ඩබ්ලිව්. ඇම්. | ... | කේයු/කප්පම්ගමුව පාසල, උඩබද්දාව. |
| පියතිලක, බී. ඇම්. බණ්ඩාර | ... | කරගහගෙදර, රජයේ මිශ්‍ර පාසල, නාරම්මල. |
| පොඩිඅප්පුහාමි, ඇම්. | ... | පනාවැන්න, කහවත්ත. |
| පොන්නුදුරේ, ඒ. වී. | ... | වෝඩ් 8, පුංකුඩුතිව්. |
| ප්‍රේමදාස, ජී. | ... | රජයේ ආරෝග්‍යශාලාව, නාවලපිටිය. |
| රාජපක්ෂ, ආර්. එල්. ඩබ්ලිව්. | ... | දුන්ගල්පිටිය, දෙවොලපොල. |
| රණවක, ආර්. ඒ. ඩී. | ... | ගම්සභා කාර්යාලය, කඳාන. |
| රත්නපාල, වයි. ඒ. | ... | " ගාමිණී " දෙරණෑගොඩ, උඩුගම්පොල. |
| රණතුංග, ඇන්. ඒ. | ... | ආණ්ඩුවේ ආරෝග්‍යශාලාව, කෑගල්ල. |
| සයිනෝරිස්, එස්. ඩී. | ... | ජයසිරි ගබඩාව, කඳාන. |
| සවුච්චනාදන්, කේ. | ... | නයිනතිව්, 2. |
| සල්ගාදු, ඇස්. ජී. ආර්. | ... | වැලිපෝන් කාර්යාලය, ගල්කිස්ස. |
| සමරසේකර, පී. ඇම්. | ... | මගපන්තිල, රජයේ මිශ්‍ර පාසල, රක්වාන. |
| සමරසේන, දොන්. ඊ. ඇම්. | ... | පිටුම්පෙ, පාදුක්ක. |
| සෙනෙවිරත්න, ඒ. | ... | ආණ්ඩුවේ ආරෝග්‍යශාලාව, ගාල්ල. |
| සිල්වා, අයි. ටී. | ... | ටී. ඇස්. සිල්වා බාරේ, 424, නාගොඩ, දෙඩන්ගොඩ. |
| සිල්වා, ඇස්. ඒ. | ... | රජයේ මිශ්‍ර පාසල, පනාගමුව, තිස්සමහාරාමය. |
| සිංගපුල්ලිය, ඇල්. එච්. | ... | කුරීකොටුව, කොබෙයිගනේ. |
| සිරිපාල, ඩබ්ලිව්. ජී. | ... | පුෂ්පාරාම මාවත, පහළ බියන්විල, කඩවත. |
| සිරිසේන, එච්. | ... | අංක 13, නිවාස යෝජනා ක්‍රමය, ගම්පහ. |
| සිවලිංගම්, ඇස්. | ... | අච්චුවැලි උතුර, අච්චුවැලි. |
| සියදෝරිස්, පී. පී. | ... | වඩුකර්මාන්ත පාසල, කිරිඇල්ල. |
| සෝමරත්න, කේ. ඇම්. | ... | ඊරියඇල්ල, හිරිවඩුන්න, කෑගල්ල. |
| සුසිරිපාල, පී. බී. | ... | බීඩී/රත්තනදෙනිය, සිංහල මිශ්‍ර පාසල, මැදගම, බිබිල. |
| තලයිසිංහම්, වී. කේ. | ... | බටහිර පුංකුඩුතිව්, පුංකුඩුතිව්. |
| තනබාලසිංහම්, කේ. | ... | තෙල්ලිපලෙයි. |
| තන්නිගාසලම් පිල්ලෙ, පී. | ... | කොපුවලව්, නාඩුකුරුච්චි, |
| තිල්ලියාර්, කේ. | ... | ඩෙල්ෆ්ට්, රජයේ ආරෝග්‍යශාලාව, යාපනය. |
| තිරිබණ්ඩා, ඇස්. ඇම්. | ... | සහනාදයක අංශය, කච්චේරිය, අනුරාධපුරය. |
| තිලකසේන, එච්. ඇස්. | ... | 53, කොටුව, මාතර. |
| තිසේරා, එච්. ඒ. ඇම්. | ... | රජයේ රෝහල, ගිරිඋල්ල. |
| වෛද්‍යසේකර, ඇස්. ජේ. ඇස්. | ... | රජයේ රෝහල, කුරුණෑගල. |
| විජේසිංහ, කේ. ජී. ඊ. | ... | ගොඩගම, තෙල්වත්ත. |
| විනී, ඇන්. ඩබ්ලිව්. පී. | ... | 2/51, නල්ලෙගහවත්ත, බෝපෙ, ගාල්ල. |

මේ අයදුම්කරුවන්ට එකවරම පත්වීම් ලබාදීමට දෙපාතීමේන්තුව බැඳී නැත. දෙපාතීමේන්තුවේ ඇබෑර්තු ඇතිවන ආකාරය අනුව ඔවුන්ට පත්වීම් දෙනු ලැබේ. සෑම පත්වීමක්ම අවුරුදු තුනක කාලයක් ගතවනතුරු ආධුනික තත්වයේ තබනවා ඇත. ඔවුන් වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, ආරෝග්‍යශාලා ලිපිකරු සේවයේ සේවා කොන්දේසි වලට ද යටත් විය යුතුය.

ඩී. ඇල්. ජේ. කහවිට,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ.

සෞඛ්‍ය දෙපාතීමේන්තුව,
කොළඹ.
1958 නොවැම්බර් 8 දින.

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### ලෝම දිග මේස් සහ කොට මේස් සැපයීම

1958 නොවැම්බර් 14 වැනි දින අංක 11,584 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළවූ නිවේදනය සම්බන්ධයෙන්, මෙරට සෑදූ දිග මේස් සහ කොට මේස් මෙන්ම, පිටරටින් ගෙන්වන ලද දිග මේස් සහ කොට මේස් සඳහාද ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා බැව් ඒ ඒ ටෙන්ඩර් කරුවන් වෙත කරුණාවෙන් දනුම් දෙමි.

ලූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරි.

1958 දෙසැම්බර් 5 වැනි ද
කොළඹ දීය.

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### බෝපතලාවේ පී. ඩබ්ලිව්. ඩී. 1ඒ කට්ටි ගෙවල් සෑදීම සඳහා ටැන්ඩර් කැඳවීමයි

කොළඹ යූනියන් පෙදෙසේ කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තුමා විසින් 1958.12.26 වැනි දින පස්වරු 2.30 වනතෙක් පහත සඳහන් ගොඩනැගිලි සෑදීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

(1) බෝපතලාවේ පී. ඩබ්ලිව්. ඩී. 1ඒ කට්ටි ගෙවල් 2ක්.

2. පෝර්ම කොළ පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංවර්ධන) තැනගෙන් ලබාගෙන ඒවායෙහි ටෙන්ඩර් පත්‍ර ලියා එවිය යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර අනුපිටපතක් ද සහිතව ලියුම් කවරයක දමා සීල් තබා ඒ කවරයෙහි " සභාපති මහතා, ටෙන්ඩර් පත්‍ර මණ්ඩලය, කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශය, යූනියන් පෙදෙස, කොළඹ " යන්න ලියා එහි මුදුනේ වම් කෙළවරේ " බෝපත්තලාවේ පී. ඩබ්ලිව්. ඩී. 1ඒ කට්ටි ගෙවල් සෑදීම සඳහා ටෙන්ඩරය " යන්නද ලියා එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර්පත්‍ර පෙට්ටියේ තැන්පත් කළ යුතු යි. එසේ නැතිනම් ඒවා රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතු යි. රෙජිස්ටර් තැපෑලෙන් නො එවන ටෙන්ඩර් පත්‍ර ටෙන්ඩර් කරුවන් විසින් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් හෝ ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට බලය දී තිබෙන නිලධාරි තැන වූ කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ සහකාර ලේකම් මහතාට භාර දිය යුතු යි. එම ටෙන්ඩර් පත්‍ර බහාලන කවරයෙහි " බෝපත්තලාවේ පී. ඩබ්ලිව්. ඩී. 1ඒ කට්ටි ගෙවල් සෑදීම සඳහා ටෙන්ඩරය " යන්න ලියා ටෙන්ඩර් කරුගේ නම හා ලිපිනයද සඳහන් කළ යුතු යි.

ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවාද ඇත.

9. පොරොන්දු පත්‍රයට හා/හෝ ඔප්පුවට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත්කර ගනු ලැබූ ටෙන්ඩර් කරුවා විසින් ගෙවිය යුතුයි.

10. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේත්, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත තබා ගනී.

11. පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුය. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක් වූ තැනැත්තෙක්ය යන්නයි.

12. 1934රේ 19 වැනි අංකය දරණ කම්කරු වන්දි ආඥාපනත (117 වැනි පරිච්ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු හෝ සේවකයෙකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වග කීමෙන් කොන්ත්‍රාත්කරුවා ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

13. කොන්ත්‍රාත්කාරයාට බාර දිය යුතු සියලු දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් නැතහොත් ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වොත් ඔහුගේ අතටම භාර දුන්නා කොට සැළකිය යුතුයි.

14. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත්කරුවා වැඩට ගැනීම ගැන විරුඬවීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ බලය ආණ්ඩුවට තබා ගනු ලැබේ.

15. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමඟ හෝ නම ඇතුළත්වූ හෝ තමාට සැහේයයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විරුද්ධ වන හෝ කිසිවකු සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

16. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියලුම මිල ගණන් යටත් පිරිසෙයින් සති 3 කට වත් වෙනස් නොවන සථිර ඒවා විය යුතුයි.

17. වැඩි විස්තර ත්‍රිකුණාමලයේ කෘෂිකර්ම කාර්යාලයේ පාලන නිලධාරි තැනගෙන් දැනගත හැක.

එම්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1958 දෙසැම්බර් මස 1 වැනි දින,
පේරාදෙනියේදීය.

---

## මුලතිව් සැපයීමේ මධ්‍යස්ථානයේ ආහාර ද්‍රව්‍ය එහා මෙහා ගෙනයාම හා පැටවීම, 1958-59

යථොක්ත සේවය සඳහා ටෙන්ඩර් පත්‍ර 1958 දෙසැම්බර් මස 16 වෙනි දින සවස 3 දක්වා මා විසින් බාර ගනු ලැබේ.

රුපියල් පණහක ටැන්ඩර් මුදල් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කරන අයට ටැන්ඩර් ආකෘති පත්‍ර 1958වේ දෙසැම්බර් මස 16 වෙනි දින දවල් 12 වන තෙක් මා විසින් නිකුත් කරණු ලැබේ.

මේ සඳහා වැඩි විස්තර කච්චේරියෙන් ලබා ගත හැක.

පී. තම්බයියා,
උප ආහාර පාලක තැන,
වවුනියාව.

කච්චේරිය,
වවුනියාව, 1.12.58.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

මහනුවර කොට්ඨාශ භාර ප්‍රාදේශික වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1958 දෙසැම්බර් මස 17 වෙනි දින පෙරවරු 10 දක්වා පහත සඳහන් වැඩ සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලද කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටැන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

කොන්ත්‍රාත්කරුවන්ගේ
ලියා පදිංචි කළ ගණන

| | |
|---|---|
| (අ) මහනුවර සංචාරක බංගලාව අළුත් වැඩියා කිරීම | රු. 12,500 |
| (ආ) හීන්ගඟ අමුණ බැඳීම ... | රු. 17,000 |

පිටපත් දෙකකින් යුක්තවූ ටෙන්ඩර් පත්‍රිකා මහනුවර වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගෙන ඉදිරිපත් කළ යුතුය. මේ වැඩ සම්බන්ධව සියළු විස්තර එම කායාීලයෙන් ලබාගත හැක.

දැනට රජයේ කොන්ත්‍රාත් වැඩ භාරව ක්‍රියා කරන අය විසින් එම වැඩවල ප්‍රමාණය ගැනද, ඒවා සතුටු දායක අන්දමින් කරගෙන යන බවද ඒ ඒ වැඩ භාර නිලධාරීන්ගෙන් සහතික ලබාගෙන ටෙන්ඩර් පත්‍ර සමග ඉදිරිපත් කළ යුතුය.

මහනුවර වාරිමාර්ග කායාීලයේ හෝ කච්චේරියක මේ එක් එක් වැඩය සඳහා රු. 25ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ කොන්ත්‍රාත්කරුවනට පමණක් 5. 12. 58 දින සිට 15. 12. 58 දක්වා රාජකාරියට නියමිත දවස් සහ වේලාවලදී මහනුවර වාරිමාර්ග කායාීලයෙන් ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරණු ලැබේ.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

පොළොන්නරුවේ ඊසාන ප්‍රදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් මින්නේරියේ ලිපිකරු නිවාසයක් සහ කම්කරු නිවාසයක් ගොඩ නැගීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ පිළිවෙලින් රුපියල් 18,000ට සහ රුපියල් 22,000ට හෝ ඉන් ඉහළ ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් වෙන වෙන ටෙන්ඩර් පත්‍ර 1958 දෙසැම්බර් මස 17 වැනි බදාදා පෙරවරු 9.30 දක්වා භාරගනු ලැබේ.

1958 දෙසැම්බර් මස 11 වැනි දින සිට 15 වැනි දින දක්වා හිඟුරක්ගොඩ තමන්කඩු උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර ලබාගනු කැමැත්තන් විසින් එක ටෙන්ඩරයකට රුපියල් 25 බැගින් තමන්කඩු උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තුමා වෙත තැන්පත් කළ යුතුයි.

මේ සම්බන්ධව සියලු විස්තර සඳහා තමන්කඩු උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තුමාගෙන් විමසන්න.

වාරිමාර්ග ඉංජිනේරු තැන,
තමන්කඩු උප කොට්ඨාශය.

වාරිමාර්ග කායාීලය,
හිඟුරක්ගොඩ,
26. 11. 58.

---

## අලෙවි සංවර්ධන කිරීමේ දෙපාතීමේන්තුව

අලෙවි සංවර්ධන කිරීමේ දෙපාතීමේන්තුවට අයත් කොළඹ මරදානේ තිබෙන ත්‍රිපොලි වෙළඳ සැලට 1. 1. 1959 සිට 31. 1. 1959 දක්වා ඇති කාලය තුළදී අළුත් බිත්තර සැපයීම පිණිස ටෙන්ඩර් පත්‍ර 1958වේ දෙසැම්බර් මස 15 වැනි සඳුදා අ. භා. 2.30 වන තෙක් කොළඹ යූනියන් ප්ලේස්හි පිහිටි ගොවිකම් සහ ආහාර ඇමති කායාීංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් භාරගනු ලැබේ.

කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 62 දරන ස්ථානයේ පිහිටි අලෙවි සංවර්ධන කිරීමේ කොමසාරිස් කායාීලයෙන් ටෙන්ඩර ෆෝරම ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි.

1958වේ දෙසැම්බර් මස 15 වැනි සඳුදා දවල් 12 වනතුරු ටෙන්ඩර ෆෝරම අලෙවි සංවර්ධන කිරීමේ කොමසාරිස් කායාීලයෙන් ලබාගත හැක.

වැඩි විස්තර කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 62 දරණ ස්ථානයේ පිහිටි අලෙවි සංවර්ධන කිරීමේ කොමසාරිස් කායාීලයෙන් දැනගැනීමට පුළුවන.

ඩබ්ලිව්. ඩී. ඕ. තිලකරත්න,
අලෙවි සංවර්ධන කිරීමේ කොමසාරිස් තැන වෙනුවට.

1958වේ දෙසැම්බර් 1 වැනි දින,
අලෙවි සංවර්ධන කිරීමේ දෙපාර්තමේන්තුව,
අංක 62, චැතැම් වීදිය.

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ (මලයි වීදිය, කොළඹ 2) ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමන් විසින් වෂී 1958 දෙසැම්බර් මස 26 වන දින පස්වරු 2.30 දක්වා පහත සඳහන් වැඩ සම්බන්ධයෙන් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ:—

| පාඨශාලාවේ නම | වැඩෙහි විස්තර |
|---|---|
| 1. ම/පත්තුනුපිටිය සි. මි. පා. ... | රසායනාගාරය |
| 2. ම/රඹුක්පිටිය සි. මි. පා. ... | රසායනාගාරය |
| 3. ම/තෙල්දෙනිය ජ්‍යෙෂ්ඨ පාසැල | රසායනාගාරය |
| 4. ම/ගිනිගත්හේන මධ්‍යම විද්‍යාලය | රසායනාගාරය |

රුපියල් 40,000 හෝ ඉන් ඉහළ ප්‍රසිඩ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ රුපියල් 20,000 හෝ ඉන් ඉහළ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන් ගෙනි.

**සංලක්ෂ්‍යය :** ම=මහනුවර දිස්ත්‍රික්කය

එක් එක් වැඩවලට ඉදිරියෙන් සඳහන්කර ඇත්තේ ඒ ඒ වැඩ වෙනුවෙන් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කරන කොන්ත්‍රාත් කරුවන් විසින් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිඩ වැඩ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිව සිටියයුතු සීමාවයි. ඉහත සඳහන් සීමා ඇතුළත ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ටෙන්ඩර් පත්‍ර වෂී 1958 දෙසැම්බර් මස 23 දින පස්වරු 3.30 දක්වා නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර ලබාගැනීම සඳහා කච්චේරියේ මුදල් බැඳීමට අවශ්‍ය වව්චර් මෙම කායභීලයෙන් ලබාගත යුතුයි. එම වව්චර් ලබාගැනීමට පෙර ලියාපදිංචි වීමේ සහතිකය ඉදිරිපත් කළයුතුයි. ටෙන්ඩර් පත්‍රිකා ලබාගැනීමට එන අය කොළඹ අධ්‍යාපන අධ්‍යක්ෂ තුමාගේ කායභීලයේ හෝ ඕනෑම කච්චේරියක රු. 100 ක් තැන්පත් කොට කුවිතාන්සියක් ඉදිරිපත් කළයුතුයි. චෙක්, මනි ඕඩර් හා පෝස්ටල් ඕඩර් භාරගනු නොලැබේ.

ටෙන්ඩර් සඳහා පිළියෙල කර තිබෙන විස්තර මේ කායභීලයේදී බලාගත හැකිය. රෙජිස්ටර් තැපෑලෙන් ටෙන්ඩර් ඉදිරිපත් නො කරන්නේ නම් පුද්ගලිකව පැමිණ, ටෙන්ඩර් භාරගැනීමට ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමන් විසින් පත්කර සිටින සහකාර නිලධාරි තැනට එම ටෙන්ඩර් භාරදී ඔහුගෙන් එය ලැබුණු බවට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

කොළඹ අධ්‍යාපන අධ්‍යක්ෂ තුමාගේ කායභීලයේ ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ඉදිරිපත් කරන ලද ටෙන්ඩර්, භාරගනු ලබන අවසාන දින සිට සති 6කට වලංගු ලෙස සලකනු ලැබේ.

ජී. එච්. බී. ඒකනායක,
මැ. ප. අධ්‍යාපන නිලධාරි තැන.

අධ්‍යාපන කායභීලය,
මහනුවර, 1958 දෙසැම්බර් මස 1 දිනදී.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

මධ්‍යම පළාතේ අධ්‍යාපන කායභීලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමන් විසින් වර්ෂ 1958 දෙසැම්බර් මස 26 වන දින පෙරවරු 10.30 දක්වා පහත සඳහන් වැඩ සම්බන්ධයෙන් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

| පාඨශාලාවේ නම | වැඩෙහි විස්තර |
|---|---|
| 1. නු/අග්‍රපතන සි. මි. පා. ... | ගොඩනැගිලි වැඩිදියුණු කිරීම දිය. |
| 2. නු/ගාමිණී විද්‍යාලය ... | කර්මාන්තශාලාව වැඩිදියුණු කිරීම. |

රුපියල් 10,000 හෝ ඉන් ඉහළ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ රුපියල් 5,000 හෝ ඉන් ඉහළ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන් ගෙනි.

**සංලක්ෂ්‍යය :**—නු=නුවරඑළිය දිස්ත්‍රික්කය.

එක් එක් වැඩට ඉදිරියෙන් සඳහන් කර ඇත්තේ ඒ ඒ වැඩ වෙනුවෙන් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කරන කොන්ත්‍රාත් කරුවන් විසින් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්ත මේන්තුවේ ලියාපදිංචිව සිටිය යුතු සීමාවයි. ඉහත සඳහන් සීමා ඇතුළත ලියාපදිංචිවූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ටෙන්ඩර් පත්‍ර වර්ෂ 1958 දෙසැම්බර් මස 23 දින පස්වරු 3.30 දක්වා නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර ලබාගැනීම සඳහා කච්චේරියේ මුදල් බැඳීමට අවශ්‍ය වව්චර් මෙම කායභීලයෙන් ලබාගත යුතුයි. එම වව්චර් ලබා ගැනීමට පෙර ලියාපදිංචි වීමේ සහතිකය ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් පත්‍රිකා ලබාගැනීමට එන අය කොළඹ අධ්‍යාපන අධ්‍යක්ෂ තුමාගේ කායභීලයේ හෝ ඕනෑම කච්චේරියක රු. 100ක් තැන්පත් කොට කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි. චෙක්, මනිඕඩර් හා පෝස්ටල් ඕඩර් භාරගනු නොලැබේ.

ටෙන්ඩර් සඳහා පිළියෙල කර තිබෙන විස්තර මේ කායභීලයේදී බලාගත හැකිය. රෙජිස්ටර් තැපෑලෙන් ටෙන්ඩර් ඉදිරිපත් නොකරන්නේ නම් පුද්ගලිකව පැමිණ, ටෙන්ඩර් භාරගැනීමට ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමන් විසින් පත්කර සිටින සහකාර නිලධාරි තැනට එම ටෙන්ඩර් භාරදී ඔහුගෙන් එය ලැබුණ බවට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

මධ්‍යම පළාතේ අධ්‍යාපන කායභීලයේ ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ටෙන්ඩර් සඳහා පිළියෙල කර තිබෙන විස්තර මේ කායභීලයේදී ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් භාරගනු ලබන අවසාන දින සිට සති 6කට වලංගු ලෙස සලකනු ලැබේ.

ජී. එච්. බී. ඒකනායක,
මැ. ප. අධ්‍යාපන නිලධාරි තැන.

අධ්‍යාපන කායභීලය,
මහනුවර, 1958 දෙසැම්බර් මස 1 දිනදී.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටැන්ඩර් බෝඩ් සභාපති තැන විසින් 1958 දෙසැම්බර් මස 19 දින පස්වරු 2.30 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

| පාසැලේ නම | වැඩ විස්තර |
|---|---|
| 1. බදි/කන්දේගෙදර ජ්‍යෙෂ්ඨ පාසැල | රසායනාගාරයක් තැනීම |

**සංලක්ෂ්‍යය :**—බදි=බදුලු දිස්ත්‍රික්කය.

2. අංක එක සඳහා රු. 20,000 ඉහළ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ අංක එක සඳහා රු. 40,000 ඉහළ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්ත මේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී සිටින අයට කොළඹ අධ්‍යාපන අධ්‍යක්ෂක තුමාගේ කාර්යාලයේ ඒ. සී., ශාඛාවෙන් හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක එක් එක් වැඩය සඳහා රු. 100 තැන්පත් කළ කුවිතාන්සියක් බණ්ඩාරවෙල අධ්‍යාපන නිලධාරිතැනට ඉදිරිපත් කිරීමෙන් 18.12.58 පස්වරු 3.30 දක්වා ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ. චෙක්පත්, මනි ඕඩර්, පෝස්ටල් ඕඩර් භාරගනු නොලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර සඳහා මුදල් තැන්පත් කිරීමට අවශ්‍ය මුදල් ගෙවීමේ කුවිතාන්සි, කොළඹ, අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ කාර්යාලයේ ගොඩනැගිලි ශාඛාවෙන් හෝ ඌව පළාතේ අධ්‍යාපන නිලධාරි තැන ගෙන් ලබාගත හැක. මුදල් ගෙවීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ දෙවන ඡෙදයේ සඳහන් පරිදි ලියා පදිංචි වී සිටින බව ඔප්පු කළ හැකි අයට පමණී.

4. ඉහත සඳහන් පරිදි පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍රිකා ඌව පළාතේ අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබා ගත හැක. මේ සම්බන්ධ සැලැස්මවල් හා සියලුම වැඩි විස්තර බණ්ඩාරවෙල අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබා ගත හැක. කොළඹ 2. මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් බෝඩ් සභාපති තැනට ටෙන්ඩර් පත්‍රිකා ලියාපදිංචි කළ තැපෑලෙන් යැවිය යුතුයි. දේශීය ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍රිකා ලියාපදිංචි කළ තැපෑලෙන් එවීමට අකමැති නම් ඔවුන් හෝ ඔවුන්ගේ ඒජන්තවරුන් සිල් තබන ලද ටෙන්ඩර් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කාර්යාල සහකාර තැනට භාර දී, එසේ භාර ගත් බවට ඒ විගසම ලියවිල්ලක් ලබා ගත යුතුයි. මුද්‍රාව තබන ලද ටෙන්ඩර් පත්‍රිකා ඇතුළත් කවරය මත ටෙන්ඩර්කරුවාගේ නම සහ ලිපිනයත් වැඩයෙහි විස්තරත් සඳහන් කළ යුතුයි.

5. කොළඹ 2 මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී 19.12.58 දින පස්වරු 2.30ට ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන්ගේ ගණන් පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ට කියවනු ලැබේ.

6. ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ඉල්ලීම් ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනයේ සිට සති හයක කාලයක් තුළ විවෘතව තැබිය යුතුයි.

7. ටෙන්ඩර් කරුවන් විසින් සේවය සඳහා බඳවා ගත හැක්කේ එම වැඩ කරන ප්‍රදේශයේ පදිංචි පුහුණු නුපුහුණු ලාංකික කම් කරුවන් පමණී. මෙය කොන්ත්‍රාත්තුවේ කොන්දේසියක් වශයෙන් සලකන බවත් එසේ කිරීමට අසමත් වන කොන්ත්‍රාත්කරුවන් කොන්දේසි කඩ කළවුන් හැටියට සලකනු ලබන බවත් සැලකිය යුතුයි. විශේෂ හේතූන් උඩ අධ්‍යාපන අධ්‍යක්ෂක තැන අධ්‍යාපන

මෙම ටෙන්ඩර් සඳහා වැඩි විස්තර පහත අත්සන් කර ඇති අය වෙතින් ලබා ගත හැක.

ඇම්. සිවනාදන්,
පරිවාස හා ළමා ආරක්‍ෂක සේවා කොමසාරිස්.

අංක 3, බගතලේ පාර,
කොළඹ 3, 1958.12.1.

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

ජනසතුසේවා හා මාර්ග ප්‍රවාහණ වැඩ පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1958 දෙසැම්බර් මස 24 වෙනි බදාදා පෙරවරු 9.30 දක්වා කොළඹ වරාය කොමිෂන් සභාවට තෙල් කඹ සපයා භාරදීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. 1958 දෙසැම්බර් මස 24 වෙනි දින පෙරවරු 10 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර් එහි පෙනී සිටින්ට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් නොඑවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් ටෙන්ඩර් භාරගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියෙකුට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාරදී ඒ පිළිබඳව එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබා ගත යුතුය.

3. ටෙන්ඩර් පිළිබඳ ලිපිලේඛන කොළඹ වරාය කොමිෂන් කාර්‍යාලයේදී පරීක්‍ෂා කළ හැක. රු. 100ක මුදලක් වරාය කොමිෂන් කාර්‍යාලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම කොළ ලබාගත හැක. ටෙන්ඩර් කොන්දේසි වලට අනුව ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

4. ප්‍රමාණයන් දක්වන සටහනේ "බිල් ඔෆ් ක්වන්ටිස්" පෙන්නුම් කර තිබෙන පරිදි එක එක් ප්‍රමාණයේ බඹ 3 ක් දිග ඇති තෙල්කඹ මෝසතර "සැම්පල්" ටෙන්ඩර්කරුවන් විසින් තමන්ගේ වියදමින් 1958 දෙසැම්බර් මස 24 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන සේ වරායේ බඩුගබඩාවට එවිය යුතුය. එසේ එවන විට ටෙන්ඩර්කරුගේ නම එහි සඳහන් කළ යුතුය.

5. ඉහත සඳහන් අන්දමට ලබාගත් ෆෝර්ම කොළවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1958 දෙසැම්බර් මස 23 වෙනි අඟහරුවාදා දවල් 12 දක්වා ටෙන්ඩර් ෆෝර්ම කොළ නිකුත් කරනු ලැබේ. පිළිගත් ටෙන්ඩරය සඳහා ඇපකරුවන් අවශ්‍යවී නම් එය සැපයීමට ටෙන්ඩර්කරු සූදානම්ව සිටිය යුතුය. ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනයේ සිට යටත් පිරිසෙයින් දින 60 ක් සෑම ටෙන්ඩරයක්ම වලංගුව පවතී.

ඩී. ජී. දයාරත්න,
වරායේ කොමසාරිස්.

1958 නොවැම්බර් මස 24 වෙනි දින,
කොළඹ වරාය කොමිෂන් සභා කාර්‍යාලයේදීය.

---

## පළාත් පාලන දෙපාර්තමේන්තුව

### ජලය සැපයීමේ යෝජනා ක්‍රමය—දඹුල්ල

මාතලේ දිස්ත්‍රික්කයේ සුළු නගර සභාවේ දඹුල්ලට නල මඟින් ජලය සැපයීමේ යෝජනා ක්‍රමයක් පිහිටුවීම සඳහා කොල්ලුපිටියේ ටරව් පාරේ අංක 135 දරණ ස්ථානයේ පිහිටි පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මංඩලයේ සභාපති විසින්, මුද්‍රා තුබූ ද්විත්ව ටෙන්ඩර් ඉල්ලුම්පත්‍ර 1959 ජනවාරි මස 3 වැනි සෙනසුරාදා උදේ 9.30 දක්වා භාරගනු ලැබේ.

2. කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ කොළඹ පරණ මහ ලේකම් කාර්යාලයේ අංක 267 දරණ කාමරයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ (සතියේ දිනවල උදේ 9 සිට සවස 4 දක්වාත් සෙනසුරාදා දිනවල උදේ 9 සිට 10 දක්වාත් වූ කාලය තුළදී) හෝ රුපියල් 250ක මුදලක් තැන්පත් කොට එයට ලැබෙන රිසිට්පුව ඉදිරිපත් කිරීමෙන් කොළඹ නෙලුම් පොකුණ පාරේ අංක 54 දරණ ස්ථානයේ පිහිටි ජල කර්මාන්ත ඉංජිනේරු මහතාගෙන් ඉල්ලුම් කිරීමෙන් ලබා ගත් ආකෘති පත්‍රයක ටෙන්ඩරය ඉදිරිපත් කළ යුතුය.

3. ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල ජල කර්මාන්තය සහ කාණු දැමීමේ කොන්ත්‍රාත් කරුවන් වශයෙන්ද, කොළඹ නාගරික සභාවේ රුපියල් 50,000 කට වඩා තක්සේරු කර ඇති වැඩ සම්බන්ධයෙන්ද ලියා පදිංචි වූවන්ට 1958වේ දෙසැම්බර් මස 27 වෙනි සෙනසුරාදා උදේ 10ට ටෙන්ඩර් ආකෘතිපත්‍ර නිකුත් කරනවා ඇත. ඉදින් දේශීය කොන්ත්‍රාත් කරුවන්, ලියාපදිංචි කළ කවරයක ඔවුන්ගේ ටෙන්ඩර් එවීමට අදහස් නොකරතොත්, කවරයේ පිට පැත්තේ විශේෂ වැඩ යත් ඔවුන්ගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙලත්, සඳහන් කොට ටෙන්ඩර් භාර ගැනීමේ බලයලත් නිලධාරියා වූ කොළඹ ටරව් පාරේ අංක 135 දරණ ස්ථානයේ පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සහකාර ලේකම් වරයාට ටෙන්ඩර් භාර දිය යුතුය.

4. ටෙන්ඩර්කරුවෝ ඔවුන්ගේ ඉල්ලීම් ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ දිනයේ පටන් සති හයක කාලයක් නැබිය යුත්තාහ.

5. ටෙන්ඩර් විවෘත කරන දිනය වූ 1959 ජනවාරි 3 වෙනි දින උදේ 10ට ටෙන්ඩර් කරුවන් කොළඹ ටරව් පාරේ අංක 135 දරණ ස්ථානයට පැමිණ සිටිය හැක. කළයුතු වැඩ සහ ඒ පිළිබඳ තොරතුරු විස්තර (ආණ්ඩුවේ නිවාඩු දින හැර) සියලුම සතියේ දවස්වල උදේ 9 සිට සවස 4.30 දක්වාත් සෙනසුරාදා දිනවල උදේ 9 සිට පස්වරු 1 දක්වාත් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ජල කර්මාන්ත ඉංජිනේරු මහතා ගෙන් ඉල්ලුම් කිරීමෙන් ලබාගත හැක.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
වැඩ බලන ප. පා. කො. වෙනුවට.

---

## අඟුල් සැපයීම

කොළඹ දිස්ත්‍රික්කයේ දිසාපති තුමා විසින් වර්ෂ 1958ක්වූ දෙසැම්බර් මස 26 වෙනි දින දහවල් 12 දක්වා බෙඩිදෙල් ලීයෙන් අඟුල් 2ක් සෑදීම සහ සැපයීම සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ:—

දිග අඩි 16½, වටකුරු ප්‍රමාණය අඩි 4½, ඝනකම අඟල් 1½.

2. ටෙන්ඩර් පත්‍රිකාවක් වෙනුවෙන් රු. 25ක් කොළඹ කච්චේරියේ තැන්පත් කිරීමෙන් මේ පිළිබඳ ෆෝර්ම 1958.12.24 දින දහවල් 12 දක්වා ලබාගත හැක.

3. මේ සඳහා වැඩි විස්තර කොළඹ කච්චේරියෙන් දැනගත හැක.

සී. ආර්. ද සිල්වා,
කොළඹ දිස්ත්‍රික්කයේ දිසාපති තුමා වෙනුවට.

1958ක්වූ නොවැම්බර් මස 28 වැනි දින,
කොළඹ කච්චේරියේදීය.

---

## කොළඹ දිස්ත්‍රික්කයේ සුළු වාරිමාර්ග වැඩ

කොළඹ දිස්ත්‍රික්කයේ සුළු වාරිමාර්ග වැඩ සඳහා කොළඹ දිස්ත්‍රික්කයේ දිසාපති තුමා විසින් 1958 දෙසැම්බර් මස 22 වෙනි සඳුදින අපරභාග 2.30 දක්වා පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් භාර ගනු ලැබේ:—

**හාපිටිගම් කෝරළය**
1. බෝතලේ පහලගම කුඩා ඔයට ආරක්ෂක බැම්මක් බැඳීම.
2. මීරිගම ගෙදර කුඹුරේ ජලදොර බැඳීම.
3. තලගම බෝතලේ ලියැද්දට ජල දොරක් බැඳීම.

**අළුත්කුරු කෝරළය "බී" කොටස**
1. පොල්වත්තෙ ජලදොර බැඳීම.
2. පලියවියන උණුහුරුවේ ජලදොර බැඳීම.
3. බෝම්බුගම්මන විහේන අමුණ බැඳීම.

**හේවාගම් කෝරළය**
1. හංවැල්ල වෙරළුගහ කුඹුරට කොන්ක්‍රීට් ජල නලයක් බැඳීම.
2. හබරකඩ තුරුවිට කුඹුරට සහ කොළඹේ කුඹුරට ජලදොරවල් දෙකක් බැඳීම.
3. වටරුක මැද ඇල අමුණ බැඳීම.

**සියනෑ කෝරළේ නැගෙනහිර**
1. පද්දවල වෙනිවැල්ලගහ කුඹුර අමුණ බැඳීම.
2. බෝපැත්තෙ ගල්වලමුල්ල අමුණ බැඳීම.
3. බෝපැත්තෙ ගුරුවල කුඹුර අමුණ බැඳීම.

**බටහිර සියනෑ කෝරළය මැද පත්තුව**
1. පස්ගම්මන ඉඑක්ඔවිට අමුණ බැඳීම.
2. බටේපොල අමුණ බැඳීම.

**බටහිර සියනෑ කෝරළේ අදිකාරි පත්තුව**
1. වල්ගම හෙට්ටගෙවල අමුණ බැඳීම.

2. එක් එක් ටෙන්ඩර් පත්‍රිකාවක් සඳහා රුපියල් 25 බැගින් කොළඹ කච්චේරියේ තැන්පත් කිරීමෙන්, මේ වැඩ පිළිබඳ ටෙන්ඩර් ෆෝර්ම කොල 1958 දෙසැම්බර් මස 19 වෙනි සිකුරාදා අපරභාග 3 දක්වා ලබාගත හැකිය.

3. මේ සඳහා වැඩි විස්තර කොළඹ කච්චේරියෙන් දැන ගත හැකිය.

සී. ඒ. ද කොස්තා,
කොළඹ දිස්ත්‍රික්කයේ දිසාපති තුමා වෙනුවට.

කච්චේරිය,
කොළඹ. 1. 12. 58.

අංක. අයි/පී. කෝ.ඇස්/463/1

## පුත්තලම දිස්ත්‍රික්කයේ සුලු වාරිකර්ම වැඩ

දකුණුපිටිගල් කෝරළේ පිහිටි පහත දක්වන සුලු වාරිකර්ම වැඩ සඳහා ගණන් යෝජනා පත්‍ර මෙයින් කැඳවනු ලැබේ :—

(1) ලිහිරියාගම වැව වැඩිදියුණු කිරිම.

(2) කහටවිල ගොඩපිටිය බැම්ම වැඩිදියුණු කිරීම.

(3) හේරත්ගේ කුඹුර බැම්ම වැඩිදියුණු කිරීම.

(4) කීනගහපිටිය බැම්ම වැඩි දියුණු කිරීම.

(5) කෝළිමඩුව බැම්ම වැඩි දියුණු කිරීම.

(6) සිංගක්කුලිය වැව වැඩි දියුණු කිරීම.

එක එක වැඩය සඳහා පුත්තලම කච්චේරියේ රුපියල් දහයක මුදලක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් අමුනා වාරිකර්ම අංශයෙන් නිකුත් කරණ ආකෘති පත්‍රවල එවන ගණන් යෝජනා පත්‍ර 1958 දෙසැම්බර් මස 10 වැනි පෙරවරු 10 වනතුරු භාරගනු ලැබේ.

1958 දෙසැම්බර් මස 9 වැනි දින පස්වරු 3 වනතුරු ගණන් යෝජනා ආකෘති පත්‍ර ලබාගත හැක.

ගණන් යෝජනා පත්‍ර විවෘත කිරීම 1958 දෙසැම්බර් මස 10 වැනි දින පෙරවරු 10 ට පටන්ගනු ලැබේ. ඒ වේලාවට ඉල්ලුම්කරුවන්ටද පෙනී සිටීමට අවසර තිබේ.

මේ සම්බන්ධයෙන් වැඩි විස්තර පුද්ගලිකව හෝ ලියවිල්ලකින් විමසීමෙන් මගෙන් ලබාගත හැක.

ඇම්. ඇෆ්. රාසනායගම්,
ආණ්ඩුවේ ඒජන්ත වෙනුවට.

1958 නොවැම්බර් 26 වැනි දින,
පුත්තලම කච්චේරියේ දීය.

---

මහනුවර බෝගම්බර හිර ගෙදර තාප්පයක් සෑදීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1958වේ දෙසැම්බර් මස 24 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී (බදාදා පෙරවරු 10.30ට) ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. මහනුවර ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැන ගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහු ගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේ බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1958වේ දෙසැම්බර් මස 19 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 22,000ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට, (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායසීලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ගුණරත්නම්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය. 58.12.2.

---

පොල්ගොල්ලේ සමුපකාර පාඨශාලාවේ කසල සෝධක මාගීයක් තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි ප්‍රවාහණ සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1958වේ දෙසැම්බර් මස 31 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. මහනුවර ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැන ගෙන් පෝර්ම කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහු ගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1958වේ දෙසැම්බර් මස 19 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ වැඩ සඳහා රුපියල් 104,000ට නො අඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට, (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලිය කියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 200ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායසීලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ගුණරත්නම්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය. 58.12.2.

---

පොල්ගොල්ලේ සමුපකාර පාඨශාලාවේ මැනේජර්වරුන්ට නේවාසි කාගාරයක් සහ ප්‍රධාන ගුරු මහතාට නිවාස සෑදීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි ප්‍රවාහණ සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1958 දෙසැම්බර් මස 31 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. මහනුවර ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු (නිර්මාණ) තැනගෙන් පෝර්ම කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1958වේ දෙසැම්බර් මස 19 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 253,000ට නො අඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට, (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 250ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායසීලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ගුණරත්නම්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය. 58.12.2.

---

වල්පිට බාලිකාවන්ගේ ගොවි පාසැලේ ගොඩනැගිලි අළුත් වැඩියා කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්ත මේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1958වේ දෙසැම්බර් මස 31 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී (බදාදා පෙරවරු 10.30ට) ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. මීගමුවේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැන ගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහු ගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1958වේ දෙසැම්බර් මස 19 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 40,000ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට, (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 50ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායසීලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ගුණරත්නම්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය. 58.12.2.

හැඳුනාව මධ්‍යම විද්‍යාලයේ මූල් ගුරු නිවාස, වැසිකිලි හා පංති කාමර ගොඩනැගිලිවල ඉතිරි වැඩ සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1958වේ දෙසැම්බර් මස 31 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. දිඹුල ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් ෆෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1958වේ දෙසැම්බර් මස 19 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 44,000ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට, (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 50ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායර්ාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ගුණරත්නම්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වෙනුවටය.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 58.12.2.

---

# බඩු බාහිරාදිය විකිණීම්

## පාවිච්චි කළ නොහැකි බඩුබාහිරාදිය වෙන්දේසියේ විකිණීම

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් අසිස්පෙට්ටි, පරණ යකඩ, බැටරි සහ වාහනවලට අවශ්‍ය ආයුධ යනාදියෙන් යුත් පාවිච්චි කළ නොහැකි බඩු බාහිරාදිය 1958 වේ දෙසැම්බර් මස 18 වන දින අපරභාග 2 ට, බොරැල්ලේ, කාසල් වීදියේ නො. 102 දරණ කෘෂිකර්ම හමුදා කර්මාන්ත ශාලාවේදී වෙන්දේසියේ විකුණනු ලැබේ. ඊට කලින් දින සිට එම බඩු බාහිරාදිය එහිදී බලාගත හැක. පහත සඳහන් ස්ථානයේදී වෙන්දේසිය සඳහා ඇති දේවල සම්පූර්ණ ලැයිස්තු බලාගතහැක.

වෙන්දේසියෙන් ගත් බඩු මුදල් ගෙවා වහාම ඉවත් කරගත යුතුයි.

ජී.ජී. ඩී. ඇස්. පී. ගුණතිලක,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂක වෙනුවට.

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව,
ඇචිලන් බැරැක්කය,
කොළඹ.

---

## අංක සී. ඇන්. 9473 දරන බෙඩ්ෆෝඩ් වෑන් රථය විකිණීමයි

ඉහත සඳහන් වෑන් රිය 1958 දෙසැම්බර් මස 19 වැනි සිකුරාදා උදේ 10.30ට මහලේකම් කාර්යාලයෙහි පිහිටි සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ මුදල් අංශයෙහි දී වෙන්දේසියේ විකුණනු ලැබේ. ඉහළම මිලට ඉල්ලූ තැනැත්තා වෙන්දේසිය අවසන්වූ වහාම මුදල් ගෙවීම ද වෑන් රිය භාරගැනීම ද කළ යුතු ය.

රථය මහ ලේකම් කාර්යාලයේ ගරාජයේදී බැලිය හැක.

සී. අරසරත්නම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

1958 දෙසැම්බර් 2 වැනිදා,
සෞඛ්‍ය දෙපාතීමේන්තුව,
මුදල් අංශය,
මහ ලේකම් කාර්යාලය,
ගාලු මුවදොර,
කොළඹ 1.

---

# විවිධ දැන්වීම්

## උවමනාකර තිබේ

ආණ්ඩුවේ කාර්යාලයකට වර්ග අඩි 3,500 ක් විශාලවූ ගොඩනැගිල්ලක් කොම්පඤ්ඤ වීදිය, කොල්ලුපිටිය, බම්බලපිටිය හෝ කුරුඳුවත්ත පෙදෙසින් වහාම උවමනා කෙරේ. ගොඩනැගිල්ලේ විස්තර සහතික පහත සඳහන් ලිපිනයට දන්වන්න.

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,
(ගොඩනැගිලි අංශය),
තැ. පෙ. 500,
කොළඹ.

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අයකරණු ලබන සංශෝධිත ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සැම සිකුරාද දිනයන්හි පළ කරණු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරණු ලබන්නේ **ප්‍රසිඩ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග **කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාද දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30 ට සහ සෙනසුරාද දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත **කඩදසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සැම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හෝ, නමක් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම හෝ පළ කරණු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, **සුප්‍රිම් උසාවියේ** පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිඩ කරණු නො ලැබේ.

10. දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා **1955** ජනවාරි **1** වැනි දින **සිට** අය කරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 10 | 0 |
| වැඩිවන සැම අඟලට හෝ ඉන් කොටසකට ... ... ... | 5 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 60 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට... ... .... | 120 | 0 |

අඟලේ සැම කොටසකටම **සම්පූර්ණ** අඟලකට අය කරණු ලබන ගාස්තුවම අය කරණු ලැබේ.

11. **සැම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරණු ලැබේ.** ප්‍රසිඩ නිවාඩු දින අතරට පැමිණෙන සැම සතියකදීම පළ කරණ දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින තුනකට ප්‍රථම **පස්වරු 4ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් අඟහරුවාද පස්වරු 4ට ප්‍රථමයෙන්).**

13. **ගැසට් පත්‍රය සඳහා දායක මුදල් වසකට හෝ ඉන් අඩකට කොළඹ රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි තැන විසින් කලින් භාරගනු ලැබේ.**

14. දායක මුදල් :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| වාර්ෂික දායක මුදල ... ... ... | එක් කාණ්ඩයක් සඳහා... | 15 | 0 |
| | I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | 7 | 0 |
| සැම කාණ්ඩයකම එක් කොටසක පිටපතකට... ... | ... ... | 0 | 25 |
| | තැපැල් ගාස්තුවත් සමග | 0 | 31 |
| I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... ... | ... ... | 0 | 10 |
| | තැපැල් ගාස්තුවත් සමග | 0 | 14 |

15. පරණ ගැසට් කොපි තිබේ නම් ඒ සඳහා ගාස්තුව දෙගුණයක් වේ. **මෙය කොළඹ, රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි තැනගෙන් ඉල්ලුම් කළ යුතුයි.**

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී